# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2443/32 - 2025 ජූලි මස 01 වැනි අඟහරුවාදා - 2025.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DSAN/LND/08/LA/05.
*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/9/2015/IR/274.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වීරගස්වැව ග්‍රාම නිලධාරි වසමේ වීරගස්වැව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 830300 කලාප අංක 05 පත්‍ර අංක 01 හි කැබලි අංක 01 සහ 02, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0866 පහත සඳහන් ඉඩම් කොටස් :

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: වැවහේන; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: මොහොට්ටිගේ ශ්‍රියාලතා, අංක 132/1, වීරගස්වැව, හකුරුවෙල; ප්‍රමාණය: හෙක්ටයාර 0.0483

**02. කැබලි අංක 02**

ඉඩමේ නම: නැත; ඉඩමේ විස්තරය: ඇළ; හිමිකම් කියන අය: මොහොට්ටිගේ ශ්‍රියාලතා, අංක 132/1, වීරගස්වැව, හකුරුවෙල; ප්‍රමාණය: හෙක්ටයාර 0.0383

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2025 සැප්තැම්බර් මස 29 වැනි දින පෙ.ව. 10.00 ට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2025 සැප්තැම්බර් මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම / පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**කෞශල්‍යා ගලප්පත්ති,**
ප්‍රාදේශීය ලේකම්,
අඟුණකොළපැලැස්ස.

2025 ජූනි මස 23 වැනි දින,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0006

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/HAR/4/2/1/63.
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය*
*යොමු අංකය* : 4-3/18/2022/WS/192.

මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ගෝනිගොඩ බූස්ටර් පොම්පාගාරයේ සිට අත්තරගම පාසල් මාවත හරහා පූජාපිටිය සේවා ජලාශය දක්වා දිවෙන සම්ප්‍රේෂණ නල එළීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම් විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ අංක 463, රජපිහිල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අත්තරගම ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙළ කරන ලද අංක 320474 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 03 හි පත්‍ර අංක 3 හි ඉ. වි. ලැ 1 හා 2 හි කැබලි අංක 2, 4, 5 ලෙස දැක්වෙන පහත විස්තර සඳහන් ඉඩම් කොටස්වලට මායිම් :

**01. කැබලි අංක 2**

ඉඩමේ නම: —; මුල් හිමිකම්පාන්නා: සොයාගත නොහැක; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර 0.0004

උතුරට : කැබලි අංක 1 සහ 3; නැගෙනහිරට : කැබලි අංක 3 සහ 5; දකුණට : කැබලි අංක 5 සහ 6; බටහිරට : කැබලි අංක 1

**02. කැබලි අංක 4**

ඉඩමේ නම: හිටිනාගෙදර වත්ත *හෙවත්* කැවුම්කොහේ වත්ත; මුල් හිමිකම්පාන්නා: කටුගස්තොට නව නගරය, අංක 48ඒ හි පදිංචි රණවන යමාන ගෙදර ගුණතිලක; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර 0.0003

උතුරට : කැබලි අංක 3; නැගෙනහිරට : ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට : කැබලි අංක 5; බටහිරට : කැබලි අංක 3

**03. කැබලි අංක 5**

ඉඩමේ නම: පල්ලේපිටියේ අරඹ සහ හිටිනාගෙදර වත්ත *හෙවත්* කැවුම්කොහේ වත්ත; මුල් හිමිකම්පාන්නා: මැදවල, අත්තරගම, අංක 80/2හි පදිංචි රාජපක්ෂ ගෙදර ජයතිලක; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර 0.0251

උතුරට : කැබලි අංක 3 සහ 4; නැගෙනහිරට : කැබලි අංක 4, ප්‍රාදේශීය සභා මාර්ගය සහ කැබලි අංක 6; දකුණට : කැබලි අංක 6; බටහිරට : කැබලි අංක 6, 1 සහ 2

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ.ව. 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2025 අගෝස්තු මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**මොහාන් ධර්මදාස,**
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2025 ජූනි මස 26 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

EOG 07 - 0007

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.